පානදුර නගර සභාව - 2022
-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පානදුර නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**1.6.1** ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපළ පිරියත උපකරණ ප්‍රත්‍යාගණනය ලාභය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ වෙනම ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂය තුළ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රත්‍යාගණන ලාභය හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ වෙනම ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ තුන්වන පරිච්ඡේදයට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | -එම- | ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.7** අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 164(2) වගන්තිය අනුව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත | සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි හෝටල් 02 කින් ගාස්තු අයකර නොතිබුණි. | ඩ්‍රැගන් හෝටලය ඉදිරි වර්ෂයේදී මුදල් ගෙවීමට එකඟ වී ඇති අතර, නැව්රෝ හෝටලය සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇත්ද යන්න තහවුරු කර ගැනීමට කටයුතු කරමින් | නගර සභා ආඥා පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පවති. ජෙට්වින් හෝටලයෙන් වරලත් ගණකාධිකාරිවරයකු විසින් සහතික කරන ලද ගිණුම් ප්‍රකාශන ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ.371 | 2000 වර්ෂයට පෙර සිට පැවත එන අත්තිකාරම් මුදල් වටිනාකම් වූ රු.1,075,318 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කර නොතිබුණි. | අයවීමට ඇති රු.1,075,318 ක අත්තිකාරම් මුදලින් රු.1,051,250 ක මුදලක් කපා හැරීම් සඳහා සභා අනුමැතිය මඟින් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් ඉල්ලීමක් කර ඇති බව. | අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2019 දෙසැම්බර් 20 දිනැති අංක 2155 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දක්වා ඇති අනුරු ව්‍යවස්ථාව | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රචාරක දැන්වීම් පුවරු 13 කින් රු.14,500 ක ගාස්තුවක් හිඟව පැවතුණි. | 2023 මාර්තු 25 දිනට දැන්වීම් පුවරු 11 කින් රු.33,200 ක් ලැබී ඇති අතර තව දුරටත් දැන්වීම් පුවරු 13 කින් රු.14,500 ක් අයවිය යුතුව තිබෙන බව. | වර්ෂයට අදාළ දැන්වීම් පුවරු අදායම් ගිණුම් ගත කළ යුතුවේ. |
| (ඈ) | 2020 දෙසැම්බර් 09 දිනැති අංක 08/2020 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ මුල්‍ය චක්‍රලේඛය | 2014 වර්ෂයේ සිට අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින ට්‍රැක්ටරයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු නිදේශය මත අළුත්වැඩියා කිරීමට හෝ අපහරණයට අනුමැතිය ලබාගෙන ඇති නමුත් අළුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැයවන බැවින් එය ඉදිරි වර්ෂයේදී සර්හිත කිරීමට කටයුතු කරන බව. | මුල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මුල්‍ය සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.74,959,597 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.63,731,152 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.2 ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) |
| වරිපනම් හා බ | 74,860,300 | 77,321,357 | 54,822,971 | 22,498,385 | 74,780,300 | 74,633,900 | 73,132,658 | 1,501,242 |
| කුලී | 10,152,100 | 6,820,587 | 2,747,037 | 4,073,550 | 1,374,960 | 13,749,600 | 8,783,532 | 4,966,068 |
| බලපත්‍ර ගාස්තු | 1,797,100 | 458,500 | 458,500 | - | 3,445,000 | 3,207,000 | 1,519,888 | 1,687,112 |
| වෙනත් ආදායම් | 236,078,610 | 1,201,679 | 1,201,679 | - | 78,137,700 | 78,137,700 | 72,133,459 | 6,004,241 |
| | 322,888,110 | 85,802,123 | 59,230,187 | 26,571,935 | 157,737,960 | 169,728,200 | 155,569,537 | 14,158,663 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.43,648,051 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට එය රු.32,125,476 ක් විය. | හිඟයෙන් කොටස් අය කරගෙන ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) වෙළඳ ස්ථාන කුලී** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට වෙළඳ ස්ථාන කුලී හිඟය රු.12,815,285 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එම හිඟ ශේෂ රු.14,276,778 ක් දක්වා වර්ධනය වී තිබුණි. | -එම- | -එම- |
| **(ඇ) මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.146,421,135 ක් විය. | මෙම මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් සිටින බව. | මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහජන පැමිණිලි | | |
| 2022 වර්ෂය තුළ ලැබී තිබුණු මහජන පැමිණිලි 61 ක් අතරින් පැමිණිලි 16 ක් 2023 පෙබරවාරි 23 දින විටත් විසදා නොතිබුණි. | තව දුරටත් පැමිණිලි 16 ක් ක්‍රියාකාරි තත්වයේ පවතින බව. | මහජන පැමිණිලි නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) ඉඩම් හා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම | | |
| 2022 වර්ෂය තුළ ලැබී තිබුණු බිම් කට්ටි සැලසුම් අයදුම්පත් 165 අතුරින් සැලසුම් 20 ක් හා ගොඩනැගිලි සැලසුම් 96 ක් අතුරින් සැලසුම් 18 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අනුමත කර නොතිබුණි. | බිම් කට්ටි සැලසුම් 20 ක් හා ගොඩනැලිගි සැලසුම් 18 ක් තව දුරටත් අනුමත විය යුතු බව. | අයදුම්පත් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් කළ යුතුය. |
| (ඇ) තිරසර සංවර්ධන හා ක්‍රියාකාරි සැලස්ම | | |
| තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීම සඳහා 2015 සිට 2030 දික්වා ව්‍යාපෘති සැලසුම් කර දිගුකාලීන සැලැස්මක් සකස් කර තිබුණ ද 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නිශ්චිත වැඩසටහන් එහි ඇතුළත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නිශ්චිත වැඩසටහන් 03 ක් හා ඊට අදාළව මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂිත තිරසර අරමුණු 03 ක් 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර ඇති බව. | දිගු කාලීන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා වාර්ෂික සැලසුම් සකස් කළ යුතුවේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පානදුර නගර සභාව සතු ඉඩම් 09ක වටිනාකම තක්සේරු කර නොතිබුණි. | ඉදිරියේදී එම ඉඩම් සඳහා තාක්සේරු වටිනාකම ලබා ගෙන ගිණුම් කටයුතු සඳහා ඉදිරිපත් කරන බව. | සභාව සතු ඉඩම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුවේ. |
| (ආ) නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.4,539,351 ක ශේෂයක් පැවති අතර, නාගරික සංවර්ධන | මෙම මුදල තන්තිරිමුල්ල පුස්තකාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් යෙදවීම සඳහා යෝජනා වි ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව ඵලදායි කාර්යයන් සඳහා යොදාගත යුතුය. |

අධිකාරියේ අනුමැතිය ඇතිව එය ඵලදායී මූල්‍ය කළමනාකරණ කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි.

## 3.3 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නෙක්ෆා කාර්යාලීය මෘදුකාංග පද්ධතිය** | | |
| නගර සභාවේ කාර්යාල කටයුතු පරිගණකගත කිරීම සඳහා විෂයන් 07 ක් සහිත මෘදුකාංග පද්ධතියක් 2017 වර්ෂ තුළ නෙක්ෆා සමාගමෙන් මිලදී ගෙන තිබුණු අතර මෘදුකාංග පද්ධතියේ සේවා ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.178,500 ක් ගෙවා තිබුණ ද මෘදුකාංගය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම මෘදුකාංග පද්ධතිය ලබා ගැනීමට වඩා දැනට භාවිතා කරනු ලබන රජයේ payroll මෘදුකාංගය වඩාත් පහසු බැවින් එය භාවිතා කරනු ලබන බව. | සේවා ලබා ගැනීමෙන් තොරව ගෙවූ ගාස්තු අයකර ගත යුතුය. |